දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක **03/2018**

PH/CF/CA/2/BUDGET/MGT/2018,

මුදල් අංශය,

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09.

2018-01-23

සියළුම කොමසාරිස්වරුන්,

සියළුම අධ්‍යක්ෂවරුන්,

සියළුම මාණ්ඩලික නිළධාරීන්,

සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්, සහකාර අධිකාරීවරුන්,

සියළුම අංශ ප්‍රධානීන්.

**<u>2018 අයවැය - ප්‍රතිපාදන උපයෝජනය හා වියදම් කළමනාකරණය.</u>**

ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(1) ව්‍යවස්ථාව හා 2017 අංක 30 දරන විසර්ජන පනතෙහි විධිවිධාන ප්‍රකාරව මේ වන විට 2018 වර්ෂයට අදාල වියදම් වෙනුවෙන් වන 2018 අංක 01 දරන සාමාන්‍ය පොදු සේවා වෙරන්ට් බලපත්‍රය හා 2018 අංක 1 දරන අත්තිකාරම් බලපත්‍රය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමන් විසින් අත්සන් කිරීමෙන් අනතුරුව එම අමාත්‍යාංශය මගින් අයවැය චක්‍රලේඛ අංක 03/2017 යටතේ ප්‍රසිද්ධියට පත්කොට ඇත. ඒ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ වන මූලස්ථානය හා ඊට අනුබද්ධ උප බන්ධනාගාර ආයතනයන්ගේ වියදම් කටයුතු වෙනුවෙන් අවශ්‍ය අයවැය ප්‍රතිපාදන ඔබ වෙත වෙන් කර දීමට කටයුතු කරනු ලැබේ. මේ වන විටත් මු.රේ 135 යටතේ වන වියදම් දැරීම සඳහා වන අධිකාරි බලය පැවරීම, දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2018 හා 01/2018(i) යටතේ සිදු කොට ඇත. ඒ අනුව සියළුම ගෙවීම් ඒකක හෙවත් උප බන්ධනාගාර ආයතන විසින් තම ආයතනයන්ට අදාල ගෙවීම් කටයුතු සිදු කල යුතු වේ.

02. 2018 වර්ෂයට අදාලව ඔබ ආයතනය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සාමාන්‍ය ක්‍රමාවේදය යටතේ නිකුත් කරණු ලබන අතර සියළුම වැය විෂයන් සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපදන එමගින් සලසා දෙනු ලැබේ. මෙම වර්ෂය තුල ඔබ ආයතනයෙහි ප්‍රතිපාදන අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කර ඇති අතර වර්ෂය පුරාවට පවතින සියළු වියදම් අදාල අයවැය ප්‍රතිපාදන සීමාව තුල කළමනාකරණය කර ගැනීමට කටයුතු කල යුතුවේ. එමෙන්ම වෙන්කර දී ඇති ප්‍රතිපාදන ප්‍රශස්ත මට්ටකින් උපයෝජනය කිරීම මගින් මනා කාර්ය සාධනයක් අත්පත් කර ගැනීමට, අදාල සියළුම වියදම් ඒකක භාර මාණ්ඩලික නිලධාරින් වගකීමට බැඳෙනු ඇත.

03. 2018 වර්ෂයේ සිට රාජ්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය නවතම ක්‍රමවේදයක් යටතේ සිදු කිරිමට භාණ්ඩාගාරය විසින් කටයුතු කරමින් පවතින අතර ඊට සමගාමිව ITMIS හා NEW CIGAS යන මෘදුකාංග හඳුන්වා දි ඇත. මෙම පරිගණකගත මෘදුකාංගය භාවිතය මගින් ගිණුම් තොරතුරු මාසිකව, භාණ්ඩාගාරය වෙත වාර්තා කිරිම මේ වන විටත් බන්ධනාගාර දෙපාර්තමේන්තුව ආරම්භ කර ඇත. ඒ අනුව මෙම වසරේ සිට පෙර වසරේ භාවිතා කරන ලද වැය බණ්ඩ වලට සමගාමීව නවතම වැය බාණ්ඩ රටාවක් හඳුන්වා දී ඇත. එම වැය බාණ්ඩ පිළිබඳ තොරතුරු නව CIGAS වැඩ සටහන සමග ඔබ වෙත ලබාදේ. ඒ අනුව මාසිකව සිදු කරණු ලබන ගිණුම් කටයුතු නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කල යුතුවේ.

04. මුදල් රෙගුලාසි ප්‍රකාරව සෑම වියදමක් සඳහාම බැඳීම් ඇතිකර ගැනිමට පෙර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසාගෙන ඇති බව, ඒ ඒ වියදම් ඒකක භාර නිලධාරීන් පෞද්ගලිකවම තහවුරු කරගත යුතුවේ. තවද 2018 වසර සඳහා වන ප්‍රතිපාදන කාර්තු හතරක් වශයෙන් බෙදා වෙන් කර ගැනිමෙන් අනතුරුව භවිතා කිරීමට සැලසුම් කරගත යුතුය. එමෙන්ම වර්ෂය තුල ජලය, විදුලිය, ඉන්ධන, අතිකාල වැනි වියදම් අරපිරිමැස්මෙන් යුතුව සිදු කිරිමටත්, අදාල වියදම් මනා කළමනාකරණයකින් යුතුව සිදු කිරීමටත් සියළුම වියදම් ඒකක භාරව කටයුතු කරනු ලබන නිලධාරින් වග බලා ගත යුතු බව අවධාරණය කරමි.

05. මෙම චක්‍රලේඛය සම්බන්ධ පැහැදිලි කර ගැනීමක් වෙතොත් මූලස්ථාන ගෙවීම් ශාඛාව (දුරකථන අංක 011-4341043/011-4677125) වෙතින් ලබාගත හැක.

එච්.එම්.එන්.සි. ධනසිංහ,

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

පිටපත:- 01. විගණන අධිකාරි (රජයේ විගණන අංශය) - දැ.ගැ.පි

02. බන්ධනාගාර කොමසාරිස් (අභ්‍යන්තර විගණන) - අ.ක.ස

# 2018 වර්ෂය සඳහා වැය විෂය අංක හඳුන්වාදීම

1 Head
1 Programme
1 Project

| Sub Project | Object Code | Item | Description | විස්තරය |
|---|---|---|---|---|
| | | | **Personal Emoluments** | පුද්ගල පඩිනඩි |
| 0 | 1001 | - | Salaries & Wages | වැටුප් හා වේතන |
| 0 | 1002 | *1* | Overtime | අතිකාල |
| | | *2* | Holiday Pay | නිවාඩු දින වැටුප් |
| 0 | 1003 | *1* | Cost of Living | ජීවන වියදම් දීමනාව |
| | | *2* | Adjustment Allowances | ගැලපුම් දීමනාව |
| | | *3* | Railway Warrants | දුම්රිය බලපත්‍ර |
| | | *4* | All Allowances by 19/2014 | 19/2014 චක්‍රලේඛයට අදාල සියළු දීමනා |
| | | *5* | Other Allowances | වෙනත් දීමනා |
| | | | **Traveling Expenses** | ගමන් වියදම් හා සංයුක්ත දීමනා |
| 0 | 1101 | *1* | Traveling & Subsistence - Domestic | ගමන් වියදම් හා සංයුක්ත දීමනා - දේශීය |
| | | *2* | Subsistence Related 19/2014 | 19/2014 චක්‍රලේඛයට අදාල සංයුක්ත දීමනා |
| 0 | 1102 | - | Traveling - Foreign | ගමන් වියදම් හා සංයුක්ත දීමනා - විදේශීය |
| | | | **Supplies** | සැපයුම් |
| 0 | 1201 | - | Stationery and office requisites | ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා |
| 0 | 1202 | - | Fuel | ඉන්ධන |
| | | *1* | *Fuel and Lubricants* | *ඉන්ධන හා ලිහිසි තෙල්* |
| | | *2* | *Fire wood* | *දර* |
| | | *3* | *Farness Oil* | *ෆර්නස් ඉන්ධන* |
| 0 | 1203 | | Diets & Uniforms | ආහාර හා නිල ඇඳුම් |
| | | *1* | *Diets* | *ආහාර* |
| | | *2* | *Uniforms & Uniform Allowance* | *නිල ඇඳුම් හා මැහුම් කුලී* |
| 0 | 1204 | - | Medical Supplies | වෛද්‍ය සැපයුම් |
| 0 | 1205 | - | Others | වෙනත් |
| | | *1* | *Prisoners' Goods* | *සිර භාණ්ඩ* |
| | | *2* | *News Papers* | *පත්තර* |
| | | *3* | *Other* | *වෙනත්* |
| | | | **Maintenance Expenditure** | නඩත්තු වියදම් |
| 0 | 1301 | *1* | Vehicles Minor Repairs | වාහන සුළු අළුත්වැඩියා |
| | | *2* | Purchasing of Tires & Tube | ටයර් ටියුබ් හා බැටරි මිලදී ගැනීම් |
| | | *3* | Vehicle Services & Other Expenses | වාහන වාර සේවා කිරීම් හා වෙනත් සුළු වියදම් |
| 0 | 1302 | - | Plant, Machinery and Equipment | යන්ත්‍ර සූත්‍ර සුළු අළුත්වැඩියා |
| 0 | 1303 | - | Building and Structures | ගොඩනැගිලි සුළු අළුත්වැඩියා |
| | | | **Services** | සේවා |
| 0 | 1401 | - | Transport | ප්‍රවාහන වියදම් |
| 0 | 1402 | - | Postal & Communication | තැපැල් හා විදුලි සංදේශ වියදම් |
| | | *1* | *Postal Expenditures* | *තැපැල් වියදම්* |
| | | *2* | *Telecommunication Expenditure* | *විදුලි සංදේශ වියදම්* |
| 0 | 1403 | | Electricity and Water | ජල හා විදුලි වියදම් |
| | | *1* | *Water Expenditures* | *ජල වියදම්* |
| | | *2* | *Electricity Expenditure* | *විදුලි වියදම්* |
| 0 | 1404 | - | Rates & Tax to Local Authority | වරිපනම් බදු |
| 0 | 1409 | - | Other | වෙනත් |
| | | | **Transfers** | මාරු කිරීම් |
| 0 | 1506 | | Property Loan Interest | රාජ්‍ය සේවක දේපල ණය පොලී ගෙවීම් |
| 0 | 1508 | | Other | වෙනත් |
| | | | **Rehabilitation & Improvement** | වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණුව |
| 0 | 2001 | - | Building and Structures | ගොඩනැගිලි පුනරුත්තාපන වියදම් |
| | | *1* | *Building and Structures* | *ගොඩනැගිලි පුනරුත්ථාපනය* |

| | | | | |
|---|---|---|---|---|
| | | 2 | *Sport Ground Imrovement* | *ක්‍රීඩා පිටි පුනරුත්ථාපනය* |
| 0 | 2002 | - | Plant, Machinery and Equipment | යන්ත්‍ර සූත්‍ර පුනරුත්තාපන වියදම් |
| 0 | 2003 | - | Vehicles | වාහන පුනරුත්ථාපනය |
| | | | **Acquisition of Capital Assets** | මූලධන වත්කම් අත්පත් කර ගැනීම |
| | 2101 | - | Vehicles | වාහන |
| 0 | 2102 | | Furniture and Office Equipment | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ |
| | | 1 | *Furniture* | *ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම* |
| | | 2 | *Information Technology Instruments* | *තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීම* |
| | | 3 | *Security Equipment* | *ආරක්ෂක උපකරණ මිලදී ගැනීම* |
| | | 4 | *Training & Industrial Equipment* | *පුහුණු හා කාර්මික උපකරණ මිලදී ගැනීම* |
| 0 | 2103 | | Plant, Machinery & Equipment | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ |
| 1 | 2104 | - | Co. of Pallekele Prison Complex | බන්ධනාගාර සංකීර්ණය ඉදිකිරීම පල්ලේකැලේ |
| 3 | 2104 | - | Co. of Jaffna Prison Stage II | බන්ධනාගාර සංකීර්ණය ඉදිකිරීම යාපනේ අධියර 2 |
| 0 | 2104 | | Building and Structures | ගොඩනැගිලි ඉදිකිරීම |
| 0 | 2106 | | Software Development | මෘදුකාංග සංවර්ධනය(සිරකරු තොරතුරු පද්ධතිය) |
| 0 | 2401 | | Capacity Building | පුහුණු හා හැකියා වර්ධනය |
| | | 1 | *Staff Training Domestic* | *නිලධාරී පුහුණුව - දේශීය* |
| | | 2 | *Staff Training Foreign* | *නිලධාරී පුහුණුව - විදේශීය* |
| 5 | 2104 | | Relocation of Prison in Other District | බන්ධනාගාර විතැන් කිරීම - වෙනත් දිස්ත්‍රික්ක |
| | | 1 | *Tangalle* | *තංගල්ල* |
| 7 | 2104 | - | Constriction of Office Building at Headquarters Premises | කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම - මූලස්ථාන පරිශ්‍රය |
| 8 | 2509 | - | Other (Prisoners Rehabilitation Prog) | වෙනත් - (රැඳවියන් පුනරුත්ථාපන වැඩසටහන) |
| | | | | |
| | | | | |

23rd.January 2018

Budget Officer of Department of Prisons

සැ.යු. :- ඉහත වැය විෂයයන් වැය ලෙජරයේ ඇතුලත් කිරිමට කටයුතු කල යුතු අතර CIGAS වැඩසටහන යටතේ වියදම් ගිනුම්ගත කිරීමේදී නිවැරදි අයිතමය(Item) යටතේ ගිණුම් තැබීමට කටයුතු කල යුතු වේ. නිවැරදි අයිතමය තොරාගැනිමේ යම් අපහසුතාවයක් වෙතොත් පහත දුරකථන අංකය යටතේ අයැවැය නිලධාරි හො සිගාස් නිලධාරී ඇමතිම මගින් සහය ලබාගත හැක. 011 4341043/011 4677125